


අන්තර්ජාලය දැනුම ලබාගන්න අපට ඉඩ ලබාදෙන සජීවී විශ්වකෝෂයකි.

අද ඔබට හඳුන්වා දෙන්නේ රැකියා මඟ තීරණයට සහ සාර්ථක කරගැන්මට අදාල ආකල්ප, දැනුම සහ කුසලතා ලබා දෙන වෙබ් අඩෙවි කිහිපයක්.

එයින් බොහොමයක අනාගත රැකියා මඟ පැහැදිලිව තෝරා ගැනීමට හැකි වන ආකාරයේ ප්‍රශ්න මාලා සහ උපදෙස් අඩංගුයි.

අන්තර්ජාලය ඇසුරින් සකස් කළේ: නිලූකා දිසානායක

# රැකියා ලොවට ආකල්ප සහ කුසලතා

මම මගේ පළමු රැකියාවට ගියේ වයස 21දී. ඒ මා සමඟ පාසැල් ගිය වැඩි දෙනෙක් විශ්ව විද්‍යාලේ යන්න ප්‍රතිඵල එන තෙක් ඔහේ ගෙවල්වලට වී කාලය අපතේ අරින අතරෙදි. මා මුලින්ම රැකියාවට ගිය දිනයේ මගේ පියා ලබාදුන් අවවාදයක් මට එදත් ප්‍රයෝජනවත් වුණා. එය අදත් ප්‍රයෝජනවත් වෙනවා. අද
රැකියා ලොවට එක්වන උපාධිධාරී හෝ උපාධිධාරී නොවන හෝ සැම දෙනාටත් කවුරුන් හෝ එම අවවාදය ලබා දුන්නා නම් එය ඇත්ත වශයෙන්ම වටිනවා. අවවාදය මෙයයි.

ඔබ රැකියාවට යන්නේ ඔබේ ආයතනයේ ගැටළු විසඳීමටයි. අලුත් ගැටළු මැවීමට නොවෙයි.

මේ අවවාදය මගේ රැකියා මග සවිමත් කළ පදනමක් මා හට ලබා දුන්නා. කලින් මා රැකියා කළ ඕනෑම තැනකට නැවත යන්නට හැකියාව මට අදත් තිබෙනවා. උපදේශකයකු ලෙස එසේ ගොස් කටයුතු කරන්නටත් මට අවස්ථාව ලැබී තිබෙනවා. රැකියා හැර යන කී දෙනෙකුට මෙසේ කියන්න පුළුවන්ද?

මේ හැකියාව ලැබුණේ මා හට කුඩා කල සිට ලැබුණ සුභවාදී ආකල්ප නිසා පමණක් නොවෙයි. රැකියා ස්ථානය තුළ සාර්ථක වීමට උනන්දුවක්ද මා තුළ තිබූ නිසයි. උනන්දුවකින් යුතුව කරන ඕනෑම දෙයක් සාර්ථක කර ගත හැකියි. එනිසාම තමයි තම අනාගත රැකියා මග තෝරා ගැනීමේදී ආර්ථික හා සමාජයීය බලපෑම් මෙන්ම රුචි අරුචිකම්ද සළකා බැලිය යුතු වන්නේ.

අද මා ඔබට හඳුන්වා දෙන්නේ රැකියා මඟ තීරණයට සහ සාර්ථක කරගැන්මට අදාල ආකල්ප, දැනුම සහ කුසලතා ලබා දෙන වෙබ් අඩෙවි කිහිපයක්. එයින් බොහොමයක අනාගත රැකියා මඟ පැහැදිලිව තෝරා ගැනීමට හැකි වන ආකාරයේ ප්‍රශ්න මාලා සහ උපදෙස් අඩංගුයි. නොමැතිනම් ඒ ගැන කණගාටු වන්න එපා. මේවායේ අඩංගු වන බොහෝ උපදෙස් අත්වැල ව්‍යාපාරික සඟරාවේ සැම කලාපයේම පළවන යොවුන් අත්වැල විශේෂාංගයේද එවැනිම තොරතුරක් ලාංකික අපට අදාල වන තවත් රැකියා මාර්ගෝපදේශනය ආකල්ප හා කුසලතා පිළිබඳ ලිපි පලවෙනවා.

- ## රැකියා මාර්ගෝපදේශන විශ්ව විද්‍යාලය

[http://www.cdm.uwaterloo.ca]

මෙම වෙබ් අඩෙවියට පිවිස තම රැකියා මග තීරණයට මෙන්ම එය සාර්ථක කර ගැනීමටද අවශ්‍ය තොරතුරු ලබා ගන්න පුළුවන්. තමන්ගේ චරිත ලක්ෂණ, ජීවන අගයයන්, කුසලතා, රුචි අරුචිකම් සහ දැනුම ලබා ගැනීම ගැනත් ස්වයං රැකියා ලොවට පිවිසීම ගැනත් තොරතුරු මෙයින් ලබා ගත හැකියි.

- ## කැරියර් කී ඩොට් කොම් - Careerkey.com

[http://www.careerkey.com ]

මෙම වෙබ් අඩෙවියේ තම ජීවන වෘත්තිය තෝරා ගැනීමට උපකාර වන ප්‍රශ්න මාලාවක් තිබෙනවා. එය අන්තර්ජාලයේම සිට (Online) පිරවීමෙන් ඔබේ රුචි අරුචිකම් හා දක්ෂතාවලට ගැළපෙන්නේ කුමන ආකාරයේ රැකියාවක්දැයි සොයා ගත හැකියි.

© නිලූකා දිසානායක 2002-2003 - දිවයින පුවත් පතෙහි පළ වූ ලිපියකි

ශ්‍රී ලංකාවේ ප්‍රථම ඊමේල් සඟරාව වන ඊසයින් අත්වැලට [ezine athwela] අදම නොමිලේ දායකවන්න.

සුභවාදී චින්තනය, නිර්මාණශීලී බව සහ තවත් වෙබ් අඩවි එකතුවක් නිතිපතා ඊමේල් මගින් ලබාගන්න.

ezineathwela@sltnet.lk

ඔබට යම් විශේෂ තේමාවක් සඳහා අදාල වෙබ් අඩවි පිළිබඳ තොරතුරු අවශ්‍යද?

ඒ ගැන අපට දන්වන්න.

අනාගතයේදී අපි ඒ ගැන තොරතුරු ඔබ වෙත ගෙන එන්නට උත්සාහ කරනවා.

ඔබට ezineathwela@sltnet.lk මඟින් අප හා සම්බන්ධ විය හැකියි.

ඒ සඳහා පහත සඳහන් විස්තර අප වෙත එවන්න.

නම:

වයස:.

ලිපිනය:

දුරකථන:

ඊමේල්:

මම

- ☐ පාසැල් ශිෂ්‍යයෙක්මි
- ☐ රැකියාවක නියුතු වෙමි
- ☐ ව්‍යාපාරිකයෙක්මි
- ☐ වෙනත් (සඳහන් කරන්න)

වයස 15 සිට 40 ඉක්මවූ අය දක්වා වයස් කාණ්ඩවලට ගැළපෙන සේ සකස් කළ ඒ ප්‍රශ්න මාලාව පිරවූ මා හට ලැබුණ පිළිතුරු අතරට රචකයෙක් පුවත්පත් සංස්කාරකවරයෙක් නැතහොත් අධ්‍යාපනඥයෙක් යනාදී විකල්ප අයත් වුණා. ඇත්තටම ලැබුණ පිළිතුරු සත්‍ය ජීවිතයට කෙතරම් කිට්ටුද යන්න ගැන මටත් පුදුම හිතුනා. දැනට රැකියා කරන අයටත් රැකියා මග තීරණය කරගන්නට අත් උදව්වක් අවශ්‍ය අයටත් පාසැල් සිසුන්ටත් මේ වෙබ් අඩවිය වටිනවා.

ඔබට අන්තර්ජාල සබඳකමක් නැතිනම් ලත වෙන්න එපා. අත්වැල ව්‍යාපාරික සඟරාවේ පාඨකයින් වෙනුවෙන් එම සේවාව අප ලබා දෙන්නට තීරණය කර එම ප්‍රශ්නමාලාව පසුගිය කලාපයක (2002 IV - 4) පළ කලා. එය සම්පූර්ණ කර එවන අය වෙනුවෙන් අප ප්‍රශ්න මාලාව අන්තර්ජාලයෙන් සම්පූර්ණ කර ප්‍රතිඵල ලබා දෙනවා. වැඩි විස්තර සඳහා 075-552524 අමතන්න.

## ● ඕ - නෙට් ඔන්ලයින් - O*NetOnline

[http://online.onetcenter.org]

රැකියා ලොව ජය ගන්නට ඔබගේ කුසලතාවලින් උපරිම ඵල ලබා ගන්නට මේ වෙබ් අඩවිය උදව් වේවි. පළමුවෙන්ම මූලික කුසලතා, ගැටළු විසඳීම, සමාජ සම්බන්ධතා, තාක්ෂණික කුසලතා සහ සම්පත් හසුරුවා ගැනීම යන විවිධ අංශ යටතේ ගොනු කළ කුසලතා රැසකින් ඔබට අදාල වන කුසලතා තෝරා ගන්නත් ඒවා සහ ඔබ දියුණු කරගැනීමට බලාපොරොත්තු වන කුසලතාද එක් කර ගත් විට ඔබට ගැළපෙන රැකියා ක්ෂේත්‍රය තෝරා ගැනීමටත් මේ වෙබ් අඩවියෙන් අත්වැලක් ලැබෙනවා.

## ● ඉගෙනුමට හා රැකියාවට අත්‍යාවශ්‍ය කුසලතා

[http://www15.hrdc_drhc.gc.ca/english/es.ssp]

අත්‍යාවශ්‍ය කුසලතා යැයි කියන්නේ තමන්ගේ රැකියාවේ සහ එදිනෙදා ජීවිතයේ කටයුතු හසුරවා ගැනීමට අප තුළ තිබිය යුතු කුසලතායි. ඒවා සාර්ථකව රැකියාවේ වගකීම් ඉටු කරන්නත් අවශ්‍ය පරිදි පරිසරයට හැඩ ගැසෙන්නත් අලුත් කුසලතා ඉගෙන ගන්නත් අපට උදව් වෙනවා. උදාහරණයක් හැටියට ලිවීමේ හැකියාව තුළින් ලේඛකයකු ලෙස තම ජීවිකාව උපයන්න වගේම ජන්ද පත්‍රිකාවක් පුරවන්නත් එය ප්‍රයෝජනවත්. ඔබේ කුසලතාවලින් උපරිම ඵල ලැබීමට තෝරා ගත යුතු රැකියාව හඳුනා ගන්නට මේ වෙබ් අඩවියට පිවිසෙන්න අත්‍යාවශ්‍ය කුසලතා ගොඩනඟා ගැන්මටද උපකාරයක් එයින් ලැබේවි.

## ● කැරියර්සෝන් - CareerZone

[www.explore.cornell.edu/newcareerzone]

කෝනල් විශ්ව විද්‍යාල වෙබ් අඩවියට සම්බන්ධ වූ කැරියර්සෝන් වෙතින් රැකියා මග සාර්ථක කර ගන්නට බොහෝ තොරතුරු ලබා ගත හැකියි.

## මේ තවත් ප්‍රයෝජනවත් වෙබ් අඩවි කිහිපයක්:

www. careerbuilder.com

www.careerhunters.com

© නිලූකා දිසානායක 2002-2003 - දිවයින පුවත් පතෙහි පළ වූ ලිපියකි